www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ජී-20 සමුලුව බරපතල අන්තර්-අත්ලාන්තික් මතභේද එළිමහනට ගෙන එයි

## G20 summit exposes deep trans-Atlantic differences

2010 ජුලි 1

පසු ගිය සතිය අග ටොරොන්ටෝවේ දී පැවැත්වුනු ජී-20 සමුලුවට හොඳ පෙනුමක් ගෙන දීමට ජාත්‍යන්තර නායකයන් කොතෙක් උත්සාහ දැරුවත් එය ප්‍රධාන පෙළේ ගෝලීය කාර්යධරයන් අතර -විශේෂයෙන් ම එක්සත් ජනපදය සහ ජර්මනිය අතර- පවතින මතභේදවල තරම වසං කරන්නක් වූයේ නො වේ.

කිසිදු එකාබද්ධ තීන්දුවකට ලඟා වීමට අසමත් වුනු සමුලුව පිලිබඳව සියලු යුරෝපීය පුවත්පත් අවඥා සහගත විය. *ල ෆිගාරෝ* නමැති ප්‍රන්ස පුවත්පතට අනුව, "ජී-20 සමුලුව සනිටුහන් කර ඇත්තේ 'තමන් හිසට තම අතම ය' යන පිලිවෙත යලි රඟ දෙන්නට පටන් ගැනීමක් ලෙසයි. අර්බුදයෙන් මිදීම සඳහා ඒකමතික ආර්ථික පිලිවෙතක් නියම කර ගැනීමට දැරූ උත්සාහය නිෂ්ඵල විය. හිඟ කපා හැරීම පිලිබඳ කල්පනාවලින් සිත පුරවා ගෙන සිටි ජර්මනිය [...], පමන ඉක්මවා ගිය කප්පාදු පිලිවෙතින් වර්ධනය අඩාල වීම පිලිබඳව නොසන්සුන් වී සිටි ප්‍රන්සය, එක්සත් ජනපදය සහ ජර්මනිය අතර මැද පිලිවෙතක සිටින අතර කිසිදු පොදු මාර්ගෝපදේශකත්වයක් පෙනෙන්නට නැත."

අත්ලාන්තිකය දෙපසට වී තරගකාරී ආර්ථික මූලෝපායන්ට පක්ෂපාතීව තර්කවිතර්කවල යෙදී ගනිමින් දේශපාලනඥයන් සහ ආර්ථිකඥයන් වාචික යුද්ධයක ද පුලුල් පෙලඹවීමක ද යෙදුනු පසුව ය සමුලුව එලඹියේ.

රාජ්‍ය නයගැති භාවයට එරෙහිව සටන් කිරීම ඉලක්ක කරන පමනට වඩා වේගවත් කප්පාදු පිලිවෙත් ගෝලීය ප්‍රකෘතිමත් වීමට බාධාවක් විය හැකි බවට අනතුරු අඟවමින් එක්සත් ජනපද ජනාධිපති බැරැක් ඔබාමා සියලු ජී-20 රාජ්‍ය ප්‍රධානීන් වෙත ලිපියක් යැවීම අසාමාන්‍ය පියවරක් විය. තමන්ගේ දේශීය ඉල්ලුම නගා සිටුවන ලෙස විශාල අපනයන අතිරික්ත සහිත රටවලින් ඉල්ලා සිටිමින් ජර්මනිය සහ චීනය එක විට ම එල්ල කර ඔබාමා පැහැදිලි ප්‍රහාරයක් මුදා හලේ ය.

ජර්මනියේ ප්‍රතිචාරය වේගවත් විය. ඊලඟ සිව් වසර තුල යුරෝ බිලියන 80ක වියදම් කැපීමක් අතැතිව සිටින ජර්මානු ආන්ඩුවේ කප්පාදු පිලිවෙත් ආරක්ෂා කරමින් ජර්මානු මුදල් ඇමති වුල්ෆ්ගැන්ග් ෂෝබල් *ෆිනෑන්ෂල් ටයිම්ස්* පුවත්පතෙහි ජූනි 23 දා ටීකාවක් ලිවී ය.

අත්ලාන්තිකය දෙපස ප්‍රධාන පෙලේ ආර්ථිකඥයන් අතර හට ගත් වාචික යුද්ධයෙන් ප්‍රධාන පෙලේ දේශපාලනඥයන් අතර හුවමාරු වන අදහස් දෝංකාර දිනි. "ඒ '30 ගනන්වල හැඟීම" යන හිසින් *නිව් යෝක් ටයිම්ස්* පුවත්පතට සැපයූ ලිපියක දී තීරු ලිපි රචක පෝල් ක්‍රුග්මාන් අනතුරු අඟවමින් කියා සිටියේ, ජර්මනියේ වත්මන් කප්පාදු පිලිවෙත

"වයිමාර් සමූහාන්ඩුවේ ඉරනම" තීන්දු කොට නාසීන්ට මග විවර කිරීමෙහි ලා ක්‍රියා කලාපයක් ඉටු කල "හෙන්රිච් බෲනිංග්ගේ පිලිවෙත්" සිහිපත් කරන බව යි. බර්ලිනය වෙත කල සංචාරයක දී - ජර්මානු ආන්ඩුවේ කප්පාදු පිලිවෙත්වලට දැඩි ලෙස පක්ෂපාතීව අදහස් දක්වන්නෙකු වන - ජර්මානු මහ බැංකුවේ [බුන්ඩෙස්බෑන්ක්හි] අධිපති ඇලෙක්ස් වෙබර්ට එරෙහිව ක්‍රුග්මාන් සිය ක්‍රෝධය වගුලේ ය. වෙබර් "යුරෝවට අනතුරක්," ක්‍රුග්මාන් කී ය.

අනතුරුව එක්සත් ජනපද ආයෝජකයෙකු වන ජෝර්ජ් සොරොස් *ෆිනෑන්ෂල් ටයිම්ස්* පුවත්පතෙහි ලියූ ටීකාවකින් ක්‍රුග්මාන්ගේ අනතුරු ඇඟවීම්වලට සහාය දැක්වීය ජර්මනියේ පිලිවෙත් යුරෝපය පුරා ම දෝංකාර දුන හොත් තිස් ගනන් ආපසු ආ හැකි යැයි ඔහු ද අනතුරු ඇඟවී ය.

රටේ ප්‍රධාන ආර්ථික පුවත්පත වන හැන්ඩ්ල්ස්බ්ලැට්හි ලියමින්, ජර්මනියේ ප්‍රමුඛ පෙලේ ආර්ථිකඥයෙකු වන වුල්ෆ්ගැන්ග් ෆ්‍රාන්ස්, ක්‍රුග්මාන්ගේ තර්කවලට කටුක අභියෝගයක් එල්ල කලේ ය. ව්‍යසනකාරී මූල්‍ය අර්බුදයට සියල්ලට මත් වඩා වගකිව යුත්තේ එක්සත් ජනපදය සහ ඇමරිකානු මහ බැංකුව යැයි ඔහු පැවසී ය.

ෆ්‍රාන්ස්ගේ ලිපියට පසුව "ඔබාමා සැලකිල්ලට ගත යුතු අම්හිරි සත්‍යයන් 10ක්" යන හිසින් තවත් වාග් ප්‍රහාරයක් එල්ල විය. ඇමරිකාව තුල ආහාර මුද්දරවලින් යැපෙන ස්වදේශිකයන් දසලක්ෂ 40ක් සිටිද්දී එක්සත් ජනපදය 2010 දී (ජර්මනියේ සියයට 5 සමග සසඳන විට) තවත් සියයට 45ක නය ලබා ගෙන ඇති බව කී ලිපිය, එය සන්තකයෙහි තිබෙන්නේ සංවර්ධිත ලෝකය තුල පවතින වඩාත් ම අසමතුලිත ආර්ථිකය යැයි පෙන්වා දුන්නේ ය.

"ඇන්ග්ලෝ-ඇමරිකානු ධනවාදයට" තඩි බෑමට සහ එක්සත් ජනපදයෙහි පවතින දරිද්‍රතාව ගැන ඇද කුද කීමට දත කට මැද ගෙන සිටිය ද හැන්ඩ්ල්ස්බ්ලට් පත්‍රය වූ කලි ජර්මනියේ දරිද්‍රතා මට්ටම් දැවැන්ත ලෙස ඉහල නගන එරට ආන්ඩුවේ කප්පාදු පිලිවෙත්වලට අයෝමය පක්ෂපාතිත්වයක් පල කරන්නකි.

මෙම නොඑකඟතාවන්ට යටින් පවතින්නේ ශීඝ්‍රයෙන් එකිනෙකට පටහැනිව යමින් තිබෙන එක්සත් ජනපද සහ ජර්මානු බැංකු අවශ්‍යතා සහ ව්‍යාපාරික අවශ්‍යතා ය.

එක්සත් ජනපද ධනවාදය සැලකිය යුතු ආර්ථික පරිහානියක් අත්විදි සමයේ දී ම ජර්මනිය ලෝක වෙලඳ පොල තුල සිය පංගුව සැලකිය යුතු ලෙස ඉහල දමා ගත්තේ ය. පසු ගිය වසර 20 තුල දී, සිය අපනයන මට්ටම දැවැන්ත ලෙස ඉහල නංවා ගැනීමට ජර්මානු ධනවාදය සමත් වී ඇත. දැනට එය පවතින්නේ, ඓතිහාසිකව පෙර නොවූ විරූ නැග්මක් වන දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 47ක මට්ටමෙහි ය. ඒ හා සසඳන විට, ලෝකයේ අනෙක් ප්‍රධාන අපනයන ජාතිය වන චීනයේ අපනයනය දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 30ක් පමනකි.

ජර්මානු අපනයනවල සිදු වුනු මෙම වර්ධනය කෙරෙහි විශාල වශයෙන් බලපා ඇත්තේ, යුරෝපය පුරා යුරෝ මුදල හඳුන්වා දෙමින් අතිමහත් ලාභ ශ්‍රම සංචිතයක් නිර්මානය කල හා ජර්මානු සුභසාධන රාජ්‍යය මත ප්‍රහාර එල්ල කල සමාජ ප්‍රජාතන්ත්‍රවාදී-හරිත පක්ෂ ආන්ඩුව (1998-2005) පවත්වා ගෙන ගිය පිලිවෙතයි. දශක දෙකකට කලින් ස්ටැලින්වාදී පිලේ රටවල් බිඳ වැටීමත් සමග නැගෙනහිර යුරෝපය සහ රුසියාව තුල විවර වුනු නව වෙලඳ පොල අවස්ථාවලින් ප්‍රතිලාභ ලැබීමට ද ජර්මනිය සමත් විය. ජර්මානු අපනයනවලින් තුනෙන් දෙකකට ආසන්න ප්‍රමානයක් (සියයට 64ක්) දැන් ගලා යන්නේ යුරෝපා සංගමයේ රටවලට ය. එක්සත් ජනපදය දැනට එම රටවලට අපනයනය කරන්නේ ජර්මානු අපනයනවලින් සියයට හතක් පමනකි.

වැඩි වැඩියෙන් සමපේක්ෂනාත්මක ගනුදෙනුවලට යොමු වෙමින් ජර්මානු කර්මාන්තය උපයා ගත් දැවැන්ත ලාභ ආයෝජනය කිරීමට ජර්මානු බැංකුවලට ශක්තිය ලබාදීම පිනිස එස්පීඩී-හරිත ආන්ඩුව ප්‍රධාන පෙලේ දේශීය මූල්‍ය නීති ගනනාවක් ද ඉවත් කලේ ය. ජර්මානු අපනයනවල නැගීම පිලිබිඹු වූයේ, ජාත්‍යන්තර මූල්‍ය වෙලෙඳ පොලෙහි ජර්මනියේ ක්‍රියා කලාපය ද ඊට සමාන පෙර නොවූ විරූ ආකාරයකින් වර්ධනය වීමකිනි.

එක් මෑත අධ්‍යයනයකට අනුව, 2008 ජූනි මාසයේ දී (එනම්, ජාත්‍යන්තර මූල්‍ය අර්බුදයට ඉතා ආසන්න අවධියේ) ලොව විශාලතම නය තොගයේ එනම් මුලු ගනන ඩොලර් ට්‍රිලියන 6.4ක හිමිකරු වූයේ ජර්මානු බැංකු ය. ප්‍රන්සය ඩොලර් ට්‍රිලියන 4.2ක් සහ බ්‍රිතාන්‍ය බැංකු ඩොලර් ට්‍රිලියන 4.1ක් වශයෙන් දෙවන සහ තෙවන තැන් හිමි කර ගත්තේ ය.

ජර්මානු අපනයන මිල දී ගැනීමට ශක්තිය ලබා දෙමින් මෙම අතිමහත් ප්‍රාග්ධන සංචිතය නයවල ස්වරූපයෙන් බොහෝ යුරෝපා රටවල් තුල ආයෝජනය කරනු ලැබින. මෙම කාල පරිච්ඡේදය තුල දී ජර්මානු බැංකුවලින් නය ලබා ගත් රටවල් අතර පෙරමුනෙහි සිටියේ දැන් බංකොලොත් භාවයට මුහුන දී සිටින ග්‍රීසිය, ස්පාඤ්ඤය සහ පෘතුගාලය යි. ඇමරිකානු "වානිජ සුරැකුම් පත්" විශාල සංඛ්‍යාවක් මිල දී ගනිමින් ජර්මානු සහ අනෙක් යුරෝපා බැංකු එක්සත් ජනපද මූල්‍ය වෙලඳ පොල තුල ද සැලකිය යුතු මුදල් ප්‍රමානයක් ආයෝජනය කලේ ය.

එක්සත් ජනපද මූල්‍ය වෙලඳ පොල තුල මැදිහත්වීමෙන් අත් පුච්චා ගත් ජර්මානු සහ අනෙක් යුරෝපා බැංකු දැන් ඇමරිකාව තුල පවතින සිය සමපේක්ෂන මුදල් තොග අඩු කර ගෙන දැනට මත් සැලකිය යුතු මට්ටමක තිබෙන යුරෝපය තුල ආයෝජන වැඩි කර ගැනීමට උත්සාහ කරමින් සිටී. පසු ගිය සිව් වසරේ දී, (ප්‍රධාන වශයෙන් ම නැගෙනහිර) යුරෝපා සංගමයේ රටවල් තුල ජර්මනිය කල ආයෝජනය සියයට 100කින් ඉහල නැග ඇත.

වසරකටත් අඩු කාලයකට පෙර එක්සත් ජනපද පාර්ලිමේන්තුව හමුවේ කල කතාවක දී ජර්මානු චාන්සලර් ඇන්ජිලා මර්කල් ඇමරිකානු සමාජ ආකෘතිය නොමසුරුව වග වර්නනා කල ද කාරනය වී තිබෙන්නේ, එකිනෙකට වෙනස් වෙමින් පවතින ආර්ථික අවශ්‍යතා ඇයගේ අභිප්‍රායන්ට පටහැනිව යමින් මෙම පශ්චාත් යුද මිත්‍ර පාක්ෂිකයන් එකිනෙකාගෙන් ඈත් කරමින් තිබීම යි.

එමෙන් ම, සිය දේශපාලන සහ මූල්‍ය බලය යුරෝපය තුල දේශපාලන අනුභාවයක් බවට පරිවර්තනය කර ගැනීමට ජර්මනිය දරන උත්සාහය

නිසා එය සහ එහි යුරෝපා හවුල්කාරයන් අතර - විශේෂයෙන් ප්‍රන්සය සමග - නව අසමතුලිතතාවන් සහ ඝර්ෂනයන් නිර්මානය වෙමින් පවතී. මෙම තත්වය ප්‍රන්ස-ජර්මානු සබඳතා පිලිබඳ ප්‍රන්ස විශේෂඥයෙකු මෙසේ අනතුරු ඇඟවීමට හේතු විය: "ජර්මානු ප්‍රශ්නය ආපහු මතු වෙලා, අපට ඒකෙන් ගැලවිල්ලක් නැහැ."

වඩාත් ම බරපතල මතභේද හට ගනිමින් පවතින්නේ එක්සත් ජනපදය සහ ජර්මනිය අතර හා දෙවන ලෝක යුද්ධය අවසාන වීමෙන් මෙපිට දී යුරෝපය තුල ම ය. මෙම ආතති වූ කලි යලි වතාවක් ගෝලීය ගැටුමක තර්ජනය මතු කරමින් දිගු කාලීන සබඳතා බිඳී යාමේ එක් ඇඟවුමක් පමනකි. මෙම අනතුරට මුහුන දිය හැකි වන්නේ, ධනපති ක්‍රමය අවසන් කිරීම සඳහා කැපවුනු සමාජවාදී ක්‍රියා මාර්ගයක් මත යුරෝපා සහ ඇමරිකානු කම්කරු පන්තිය එකමුතු කිරීම තුලින් පමනකි.

ස්ටීවන් ස්ටයින්බර්ග්

© www.wsws.org